# ගුරු - විදුහල්පති වෘත්තීය සමිති සන්ධානය

2021.08.09

පොලිස්පතිතුමා
පොලිස් මූලස්ථානය
කොළඹ.

පොලිස්පතිතුමනි,

**උද්ඝෝෂණවලට සහභාගි වූ ගුරුවරු සහ විදුහල්පතිවරු අනීතික ලෙස අත්අඩංගුව ගැනීම පිළිබඳව**

ගුරු-විදුහල්පතිවරුන්ට පවතින වැටුප් විෂමතාවට විසඳුම් ලබාදෙන ලෙස බල කරමින් දිවයින පුරා පාසල්වල ගුරුවරු සහ විදුහල්පතිවරු වෘත්තීය ක්‍රියාමාර්ගවල නිරතව සිටී. එම වෘත්තීය ක්‍රියාමාර්ග අතර, විවිධ ප්‍රදේශවල උද්ඝෝෂණ ක්‍රියාමාර්ග ගණනාවක් ද ක්‍රියාත්මක කරමින් පවතී.

2021.08.04 දින කොළඹ ප්‍රදේශ කිහිපයකින් රථ පෙළපාලි මගින් කොළඹ නගරයට පැමිණ ජනාධිපති ලේකම් කාර්යාලය අසල උද්ඝෝෂණයේ නිරත වූ ගුරු-විදුහල්පතිවරු උද්ඝෝෂණය අවසන් වී ආපසු යමින් සිටියදී පොලිසිය විසින් විවිධ ස්ථානවල දී ගුරුවරියන් 16 දෙනෙකු ඇතුළු 44 දෙනෙක් අත්අඩංගුවට ගෙන කොළඹ වරාය පොලීසියේ රඳවා තබා 2021.08.05 දින කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලද අතර අධිකරණයෙන් ඔවුන් ඇප මත නිදහස් කරන ලදී.

එසේම මහනුවර ප්‍රදේශයේ 2021.08.01 දින පැවති දෙමව්පිය උද්ඝෝෂණයට සහ 2021.08.04 දින පැවති ගුරු-විදුහල්පති උද්ඝෝෂණයට සහභාගි වූ ගුරුවරු, විදුහල්පතිවරු සහ දෙමාපියන් පිරිසක් සම්බන්ධයෙන් පොලීසිය අධිකරණයට කරුණු වාර්තා කර ඔවුන් 2021.08.11 දින අධිකරණය වෙත කැඳවා ඇත.

එසේම 2021.07.20 දින මාතර ප්‍රදේශයේ දී උද්ඝෝෂණයකට සහභාගි වූ ගුරුවරියක් ඇතුළු තිදෙනෙක් ඊයේ දින සහ අද දින අත්අඩංගුවට ගෙන පොලිස් ඇප මත මුදාහැර ඇති අතර, 2021.08.16 දින ඔවුන් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

අද (2021.08.09) දින යාපනයේ ගුරු-විදුහල්පතිවරු විසින් පැවැත් වූ රථ පෙළපාලියේ ඉදිරියෙන් ගමන් කළ වාහනයේ රියදුරු 2021.08.10 දින ප.ව. 5.00 පොලීසියට කැඳවා ඇත.

උද්ඝෝෂණයේ යෙදීමට හා විරෝධය දැක්වීමට ඇති අයිතිය උල්ලංඝණය කරමින් පොලීසිය විසින් කෝවිඩ් 19 නිරෝධායන පිළිවෙත්වලට මුවා වී ඉහත ආකාරයෙන් අත්තනෝමතිකව ගුරුවරු සහ විදුහල්පතිවරු අත්අඩංගුවට ගැනීම පිළිබඳව අවධානය යොමු කර එම අත්තනෝමතික කටයුතු නතර කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමු.

මෙයට,



ජෝසප් ස්ටාලින් - ලංකා ගුරු සංගමය



මහින්ද ජයසිංහ - ලංකා ගුරුසේවා සංගමය



යල්වෙල පඤ්ඤාසේකර හිමි
සමස්ත ලංකා එක්සත් ගුරු සංගමය



සුනිල් ප්‍රේමතිලක - විදුහල්පති සේවා
සංගමය





මොහාන් පරාක්‍රම වීරසිංහ
ශ්‍රී ලංකා ජාතික විදුහල්පති සංගමය

ජගත් ආනන්ද සිල්වා
ස්වාධීන අධ්‍යාපන සේවක සංගමය



සංජීව බණ්ඩාර

ඒකාබද්ධ ගුරු සේවා සංගමය



මයුර සේනානායක

ලංකා ප්‍රගති ගුරු සංගමය



නිර්මාලා ගමගේ
කතෝලික ගුරු සංගමය
සංවිධානය



ඩබ්.ඩබ්.ජේ.එල්.එච්. රොවෙල්
පුහුණු විද්‍යාපීඨ හා උපාධිධාරී ගුරු



එන්.බී. චුලරත්න

ලංකා ගෘහ වි. හා කෘෂි වි. ඩිප්ලෝ: සංගමය



එම්.කේ. මොහොමඩ් නියාර්

ශ්‍රී ලංකා ඉස්ලාම් ගුරු සංගමය



පී.එම්. පුංචිහෙට්ටි
ස්වාධීන ලංකා ගුරු සංගමය



මීගහජඳුරේ සීලානන්ද හිමි
ලංකා පිරිවෙන් ගුරු සේවා සංගමය



එස්.ජී.එම්. සමරකෝන්
සමස්ත ලංකා ගුරු උපදේශකවරුන්ගේ සංගමය

ශ්‍රේණිධාරී විදුහල්පති සංගම් එකමුතුව
ශ්‍රී ලංකා ජාතික ගුරු සංගමය
කඳුරට ගුරු පෙරමුණ
ගුරු විමුක්ති පෙරමුණ
ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ගුරු සංගමය
ශ්‍රී ලංකා අධ්‍යාපන සමාජ සම්මේලනය
වතු ගුරු සංගමය
ජාතික ගුරු සභාව
එක්සත් ද්‍රවිඩ ගුරු සංගමය